**MEDIA RELEASE – 25 FEB 2011**

# වෙළෙඳසේවා A කාණ්ඩයේ ක්‍රිකට් ශූරතාව සෙලාන් බැංකුවට

වෙළෙඳ සේවා A කාණ්ඩයේ පිළිමළුන් පිටුදැකීමේ ක්‍රිකට් කිරුළට හිමිකම් කියමින්
සෙලාන් බැංකුව අද්විතීය ජයග්‍රහණයක් වාර්තා කරයි

වෙළෙඳ සේවා ක්‍රිකට් ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් සෙලාන් බැංකු ක්‍රිකට් පිල, වෙළෙඳ සේවා A කාණ්ඩයේ පිළිමළුන් පිටුදැකීමේ ක්‍රිකට් ශූරතාව දිනා ගැනීමට පසුගිය දා සමත්විය. ඒ අවසාන මහා තරඟයේ දී ප්‍රබල MAS යුනිචෙලා කණ්ඩායම පරදවමිනි. සෙලාන් බැංකුව මෙම ශූරතාව දිනා ගනු ලැබුවේ ඉතිහාසයේ පළමුවරට වීම මෙහි ඇති විශේෂත්වයයි. කණ්ඩායමේ ක්‍රීඩකයින් සියලු දෙනාම එකාවන්ව ක්‍රීඩා කරමින්, ඉහළ කැපවීමකින් ලබාගත් මෙම ජයග්‍රහණය, ව්‍යාපාර ලෝකයේ දී සෙලාන් බැංකුව විසින් ලබා ගන්නා ලද ජයග්‍රහණයන් සේම අතිවිශිෂ්ට එකක් බව සියලු දෙනාගේ අදහසයි.

පසුගිය වසරේ පැවති මෙම ලීග් තරඟාවලියේ දී පහළ අඩියක සිටි සෙලාන් බැංකු කණ්ඩායම මෙවර පෙර පැවති සියලු බැමි බිඳදමමින් ලබා ගත් මෙම ජයග්‍රහණය සියලු දෙනාගේ ඉහළ ඇගයීමට පාත්‍ර විය. ව්‍යාපාර ලෝකයේ දීද පසුගිය කාලයේ දී ඇති වූ විවිධ දුෂ්කරතා මධ්‍යයේ මේ වන විට සෙලාන් බැංකුව සාධනය කර ඇති තත්ත්වය සිහිගන්වමින් පසුගිය වසරේ අවසාන පෙළ සිට මේ වසරේ ශූරතාවය අත්පත් කර ගැනීම දක්වා සෙලාන් බැංකු කණ්ඩායම දැක්වූ දක්ෂතාවන් අළු මතින් නැගී සිටීමේ හැකියාව මොනවට පෙන්වාලීමට සමත් වූ කාරණයක් බව කිව මනාය.

කාසියේ වාසිය දිනාගනිමින් පළමුව පන්දුවට පහර දීමට, යුනිචෙලා කණ්ඩායමේ නායක මලින් සිල්වා තීරණය කළ ද, ඔහුගේ තීරණය නිවැරදි නොවන බව ඒත්තු ගැන්වීමට සෙලාන් බැංකු පන්දු යැවීමේ බලඇණියට වැඩිවේලාවක් ගත නොවීය. ඒ සෙලාන් බැංකු පිලේ වේගපන්දු යවන ක්‍රීඩක කෞෂල්‍යා වීරරත්නගේ ක්‍රියාත්මක වීමත් සමඟය. සිය ප්‍රථම පන්දුවාර කිහිපයේ දීම යුනිචෙලා කණ්ඩායමේ මුල් කඩුළු 4, ලකුණු 51 ක් තුළ දවාලමින් යුනිචෙලා මුල්පෙළ ක්‍රීඩකයින් පසු බැස්සවීමට ඔහු සමත්විය.

මෙහිදී සෙලාන් බැංකු පිළ වෙනුවෙන් අනගි මෙහෙවරක් ඉටුකළ මදවේග පන්දු යවන ක්‍රීඩක තාරක කොට්ටහේවා ද පන්දුවෙන් දස්කම් දක්වමින් ලකුණු 46 කට කඩුළු 3 ක් දවාලීමට සමත්විය. සිය කණ්ඩායම අසීරු අඩියක වැටී තිබුණු අවස්ථාවේ දී හුදෙකලා ඉනිමක් ක්‍රීඩා කරමින් යුනිවෙලා නායක මලින් සිල්වා අනගි ශතකයක් වාර්තා කිරීමට සමත්වූ අතර, ඒ හේතුවෙන් කඩුළු 8 කට ලකුණු 199 ක් ලෙස තරගකාරී ලකුණු එකතුවක් ලබා ගැනීමට යුනිවෙලා කණ්ඩායම සමත්විය.

සෙලාන් බැංකු පිල වෙනුවෙන් කාංචන ගුණවර්ධන හා ලසිත් ප්‍රනාන්දු ආරම්භක පිතිකරුවන් ලෙසින් මෙම ජයග්‍රාහී ඉලක්කට හඹායෑමට පිටියට පිවිසි අතර, සෙලාන් බැංකු කණ්ඩායමට එම ඉලක්කය තරමක අභියෝගාත්මක එකක් වූයේ ඉතා ඉක්මනින් සිය කඩුළු කිහියක්ම දවාගනැනීමට යුනිවෙලා පන්දු යවන්නන් සමත් වූ නිසාය. කෙසේ වෙතත් සෙලාන් බැංකු පිලේ අභිමානය රැක ගනිමින් මනහර ලෙස පන්දුවට පහරදුන් ලසිත් ප්‍රනාන්දු සිය පිල වෙනුවෙන් ලකුණු 41 ක් රැස් කිරීමට සමත්විය. අනතුරුව පිටියට පිවිසි ශ්‍රී ලංකා ටෙස්ට් ක්‍රිකට් පිලේ ආරම්භක පිතිකරු තරංග පරණවිතාන, තමන්ගෙන් කණ්ඩායමට විය යුතු උපරිම දායකත්වය ලබාදෙමින් ලකුණු 51 ක් රැස් කිරීමට සමත්විය. තරංග පරණවිතාන හා නායක චානක විජේසිංහ අතර ගොඩනැගුණු සම්බන්ධතාව සෙලාන් බැංකු පිලේ ජයග්‍රහණය තහවුරු කළේ තවත් පන්දු 7 ක් ඉතිරි ව තබමිනි. පන්දු යැවීමේ දී සුපිරි දක්ෂතාවන් ප්‍රකට කළ කෞෂල්‍ය වීරරත්න, සෙලාන් බැංකු ක්‍රිකට් සංචිතයෙහි අනගි වත්කමක් බව ඔප්පු කිරීමට සමත්විය.

සෙලාන් බැංකු ක්‍රිකට් කණ්ඩායම ලබා ගත් මෙම ජයග්‍රහණය නැවත වරක් ජයග්‍රාහී මාවතට පැමිණ සිටින සෙලාන් බැංකුව විසින් ලබා ගත් තවත් විශිෂ්ඨ ජයග්‍රහණයකි.

**ඡායාරූපය** - සෙලාන් බැංකු ක්‍රිකට් කණ්ඩායම සෙලාන් බැංකු සභාපති ඊස්ට්මන් නාරංගොඩ සහ බැංකු උපදේශක  අජිත පැස්කුවල් යන මහත්වරුන්  සමඟ කෝල්ට්ස් ක්‍රීඩාංගනයේදී ජයග්‍රහණයෙන් අනතුරුව ලබාගත්  ඡායාරූපය

**<u>Media Contact</u>**

Tilan Wijeyesekera as DGM (Marketing) Seylan Bank 077 2268 600

Adahas PR Kumar 0777 379 973. Tharindra 0777 560 611